ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.

VII සභා වාරය පනස් හයවන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.
දිනය : 2022.10.11.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ජ්. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ජ්. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
22.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
23.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:
සියලුම මන්ත්‍රීවරුන් සහභාගී වී ඇත.

නිලධාරී සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.
03. සංවර්ධන නිලධාරි - ජේ.ඩී.පී. තක්ෂිලා ආරියදාස මෙනවිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් හයවන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් සහ මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.09.13. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් 2022.09.13. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

වෙනත් කරුණු පිටු අංක 14 සහ 05 වන ඡේදයේ හි,
" සමෘද්ධි සහනාධාර දීමනාව ලබා දීම පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී කිහිප වාරයක් අදහස් ඉදිරිපත් කළා. මේ පිළිබඳව නිලධාරින් සමඟ සාකච්ඡා කල අවස්ථාවන් වලදී මන්ත්‍රිවරුන් ලබා දෙන නාම ලේඛනයට සමෘද්ධි රු. 5000 සහනාධාර දීමනාව ලබා දෙන බව ප්‍රකාශ කරමින් නිලධාරින් මා සමඟ අමනාප වූ අවස්ථාවන් ද තිබුණා. මේ සම්බන්ධයෙන් එම නිලධාරින් ඒකාධිකාරයක් පවත්වාගෙන යන බවක් දක්නට තිබෙනවා." යන සඳහන
" සමෘද්ධි සහනාධාර දීමනාව ලබා දීම පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී කිහිප වාරයක් අදහස් ඉදිරිපත් කළා. නිලධාරි සමඟ සාකච්ඡා කර සහනාධාර දීමනාව ලබා දීම සඳහා නාම ලේඛනය සකස් කලත් වෙනත් අයට රු. 5000 සහනාධාර දීමනාව ලබා දීම පිළිබඳව මා විසින් විමසූ අවස්ථාවන් වලදී මා සමඟ අමනාපකම් ඇති වූ අවස්ථාවන් ද තිබුණා. මේ නිසා නිලධාරින්ට අවශ්‍ය අයට සකසන නාම ලේඛනයට මෙම දීමනාව ලබා දෙන බවට හැඟීයනවා." ලෙස ප්‍රකාශ කල බවට සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2022.09.13. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
(i). බල ප්‍රාදේශයේ සංවර්ධනය කරමින් පැවැති මාර්ගවල සංවර්ධන කටයුතු අතරමඟ නතර වී ඇති බැවින් එම මාර්ගවල සංවර්ධන කටයුතු කඩිනම් කරදෙන ලෙසට, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට කටයුතු කල අතර ඒ අනුව සභාව ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා පවත්නා විධි විධාන යටතේ සුදුසු ක්‍රියා මාර්ග ගන්නා ලෙසත්, එම ක්‍රියා මාර්ග පිළිබඳව සති දෙකක් ඇතුළත අමාත්‍යාංශය වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යවා තිබෙනවා.

(ii). බලංගොඩ, ඉඹුල්පේ, පින්නවල පිහිටි ප්‍රජා මූල සංවිධානයේ වත්මන් තත්ත්වය පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශයට දන්වා යැවීමට කටයුතු කළා. මෙම ව්‍යාපෘතිය නිමා කිරීම සඳහා ජලනල ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙසත් ඒ බව සති දෙකක් ඇතුළත ජල සම්පාදන අමාත්‍යාංශය වෙත වාර්තාවක් ලබා දෙන ලෙස ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව එම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් සභාව වෙත පිටපත් සහිතව දන්වා එවා තිබෙනවා.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). මැතිවරණ කොට්ඨාසයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකතුමාගේ මඟ පෙන්වීම යටතේ කණ්ඩායමේ කටයුතු ශක්තිමත්ව ඉදිරියට මෙහෙයවීම සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක ධුරය සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා පත් කරන ලද බව එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් විසින් දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
ප්‍රාදේශීය සභා පනත සහ රීති අනුව ප්‍රාදේශීය සභාවක සභාපති, උප සභාපති සහ මන්ත්‍රීවරු පමණක් නියෝජනය වුවත් සම්ප්‍රදායානුකූලව පක්ෂ ජ්‍යෙෂ්ඨත්වය මත ආසන පැනවීම සිදු වුණා. එම නිසා එ.ජා.ප. මන්ත්‍රීවරු හයදෙනා සමඟ සාකච්ඡා කර ආසන පැනවීම පිළිබඳව ලේකම්තුමියට දැනුම් දෙන්න.

(ii). ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතා ලබා ගැනීම හේතුවෙන් සභාවට අයත් පඹහින්න ජල ව්‍යාපෘතියෙන් ජල සම්බන්ධතා ලබා ගෙන ඇති ජල පාරිභෝගිකයන් එකොළොස් දෙනෙකුගේ ජල සම්බන්ධතා විසන්ධි කිරිම හා ඒ සම්බන්ධයෙන් විස්තර ඇතුළත් නාම ලේඛය මහ සභාවේ දැන ගැනීමට ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
පඹහින්න ප්‍රදේශයේ ජල සබඳතා දෙකම ලබාගෙන ඇති ජල පාරිභෝගිකයන්ගෙන් සභාවට අය කර ගැනීමට අවශ්‍ය හිඟ ජල ගාස්තු අය කර ගැනීමෙන් අනතුරුව, සභාව විසින් සපයා ඇති ජල සම්බන්ධතාවයන් සියල්ල කඩිනමින් විසන්ධි කිරිමට කටයුතු කරනවා.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නැත.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත මුදල් හා ප්‍රතිපත්ති සැළසුම් කමිටුවට ඉදිරිපත් කර එම කමිටු අනුමැතිය ලද බව දන්වා එය සාකච්ඡා කිරීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරමින් සෑම මන්ත්‍රීවරයෙකුටම අයවැය කෙටුම්පතේ පිටපත් ලබා දීමට කටයුතු කළ බැවින්, අයවැය කෙටුම්පතේ සඳහන් එක් එක් අයිතම පිළිබඳව කියවීමට මා කාලය ගත නොකරන බවත් 2023 වර්ෂය සඳහා ආදායම :- 143,574,375.16, වියදම :- 143,573,045.64, අතිරික්තය :- 1,329,52 ක් බවත් ප්‍රකාශ කරන ලදී.

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා සභාගත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා විසින් සාකච්ඡා කිරීමට ඉදිරිපත් කල 2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

සාකච්ඡා කිරීමට සභාගත කරන ලද 2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සභා සම්මත කිරිම සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා සාකච්ඡා කිරීමට ඉදිරිපත් කල 2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පතට විරෝධය දක්වන බව ප්‍රකාශ කරන ලදී.

අයවැය කෙටුම්පත සඳහා විරෝධය ප්‍රකාශ කිරීමත් සමඟ ඡන්දයක් විමසීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ලේකම්තුමිය වෙත දැනුම් දෙන ලදී. ඉන් අනතුරුව ලේකම්තුමිය විසින් 2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සඳහා ඡන්දය විමසීමේ දී සෑම මන්ත්‍රීවරයෙක්ම අත් ඔසවා පක්ෂ ද විරුද්ධ ද යන

වග ප්‍රකාශ කරන ලෙසට දැනුම් දෙන ලදී. ලේකම්තුමිය විසින් නමින් නමට නම් ආමන්ත්‍රණය කිරීමෙන් අනතුරුව, ඡන්ද විමසීමේ කටයුතු ආරම්භ කරන ලදී.

| 2023 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කිරීම - ඡන්ද විමසීම | | | | | |
|---|---|---|---|---|---|
| අනු අංකය | නම | අයවැයට | | | |
| | | පක්ෂ ඡන්ද | විරුද්ධ ඡන්ද | නොපැමිණි | තීරක ඡන්ද |
| 1 | ගරු සභාපති එස්.ජී.වී.ඒ.ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා | √ | | | |
| 2 | ගරු උප සභාපති එච්.එම්.වසන්ත බන්දුසේන මැතිතුමා | √ | | | |
| 3 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ආර්.ජයානන්ද මැතිතුමා | √ | | | |
| 4 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික රෝහණ ජයමාන්න මැතිතුමා | √ | | | |
| 5 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා | √ | | | |
| 6 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය | √ | | | |
| 7 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර්.දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා | √ | | | |
| 8 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා | √ | | | |
| 9 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දෙවටගේ ධර්මදාස මැතිතුමා | √ | | | |
| 10 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩී.එන්.අබේවික්‍රම මැතිතුමා | √ | | | |
| 11 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.අජිත් බණ්ඩාර මැතිතුමා | √ | | | |
| 12 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.සමන්ත ජයසිංහ මැතිතුමා | √ | | | |
| 13 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ජී.සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය | √ | | | |
| 14 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.සුමිත් ගුණරත්න මැතිතුමා | √ | | | |
| 15 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා | | | √ | |
| 16 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.අමිල සමන් ගුණසේකර මැතිතුමා | | | √ | |
| 17 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා | | | √ | |
| 18 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.එම් චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය | | | √ | |
| 19 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය | | | √ | |
| 20 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා | √ | | | |
| 21 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා | | | √ | |
| 22 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරංග මැණික් විජේතුංග මැතිතුමා | | | √ | |
| 23 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී මුනියන්ඩි මල්ලිකා දේවී මැතිතුමිය | √ | | | |
| 24 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා | | | √ | |
| 25 | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එච්.එම්.ගුණසේන මැතිතුමා | | √ | | |
| | එකතුව | 16 | 01 | 08 | |

2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සඳහා,
පක්ෂව ඡන්ද :- 16 කි.

විරුද්ධව ඡන්ද :- 01 කි.
නොපැමිණි :- 08 කි.
ඒ අනුව වැඩි ඡන්ද 16 කින් 2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සභා සම්මත විය.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
සාකච්ඡා කිරීමට සහාගත කරන ලද 2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සභා සම්මත කිරීම සඳහා ඡන්දය ලබා දෙමින් සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් විරෝධය දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එච්.එම්.ගුණසේන මැතිතුමාටත් මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි. බදු බර පනවා බල ප්‍රදේශයේ ජනතාව පීඩනයට ලක් නොකර, විෂය නිලධාරීන් ලබා දුන් දත්තයන් සැලකිල්ලට ගනිමින්, එම දත්තයන් විශ්ලේශනය කරමින්, වියදම් කළමනාකරණය කර ගනිමින් රට තුල ආර්ථික හා දේශපාලන වශයෙන් පැවැති විවිධ අසීරුතා මැද අයවැය කෙටුම්පත සකස් කළා. මේ සඳහා සහයෝගය ලබාදුන් ලේකම්තුමියටත්, හිටපු ප්‍රධාන සංවර්ධන නිලධාරි වශයෙන් කටයුතු කල යූ.ඩී. නිලන්ත පුෂ්ප කුමාර මහතාටත්, ඒ මහතා අප ආයතනයට සති දෙකක කාලයක් සඳහා නිදහස් කර දීමට කටයුතු කල පළාත් පාලන කොමසාරිස්තුමාටත්, ජේ.ඩී.පී. තක්ෂිලා ආරියදාස මෙනවියටත්, සංවර්ධන නිලධාරි ටී.ටී. රුවන්දිකා මහත්මියටත්, කාර්යාලයේ සෙසු නිලධාරීන් සියලුදෙනාටත් මාගේ ස්තුතිය පිරිනමනවා.
බල ප්‍රදේශයේ සංවර්ධන යෝජනා සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වෙන් කර ඇතත් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා සංවර්ධන යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් නොකරන ලෙස චක්‍රලේඛ මගින් දැනුම් දී ඇති බැවින් ප්‍රතිපාදන ලබා දීමට හැකියාවක් නැතත් අනුමැතිය ලත් වහාම එම ප්‍රතිපාදන මන්ත්‍රීවරුන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනවා.

2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සඳහා අදහස් ප්‍රකාශ කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එච්.එම්.ගුණසේන මැතිතුමාට අවස්ථාව ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එච්.එම්.ගුණසේන මැතිතුමා අදහස් දක්වමින්,
මෙම අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව මා සෑහීමකට පත් වන්නේ නැහැ. සෞඛ්‍ය සේවය සඳහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙනුවෙන් ලක්ෂ 18 ක මුදලක් වෙන් කර තිබුණත් 2022 /06/30 දිනට මාස හයක් සඳහා එහි ආදායම වී තිබුණේ රුපියල් 38,115.00 ක මුදලකි. එම මුදල හයෙන් ගුණ කළත් 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම උපයා ගැනීමට හැකි වන්නේ නැහැ. එම ස්ථානයේ එවැනි නිෂ්පාදන ක්‍රියාවලියත් සිදු වන්නේ නැහැ.
එමෙන්ම යන්ත්‍ර කුළියට දීම සම්බනධයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ දී පසුගිය වසරේ ලක්ෂ දහයක මුදලක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2022/06/30 දිනට උපයා තිබුණේ එක්ලක්ෂ පනස්තුන්දහස් හයසිය හැත්තෑ පහකි. 2023 වර්ෂය සඳහා ලක්ෂ විස්සක මුදලක් ඇස්තමේන්තු කර තිබුණත් පසුගිය වසරේ මාස හයක් සඳහා උපයා තිබෙන මුදල දහ ගුණයෙන් ගුණ කළත් ඇස්තමේන්තු මුදල උපයා ගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. එමෙන්ම මේ අවස්ථාව වන විට සභාවට අයත් බැකෝ යන්ත්‍රය කුළී පදනම මත සපයනවාද? අක්‍රිය වෙලාද? කීප දෙනෙක් මාගෙන් ඒ පිළිබඳව විමසුවා. බැකෝ යන්ත්‍රය කුළී පදනම මත සපයන්නේනම් මෙම මුදල ඉක්මවා යා යුතු බව මට හැඟෙනවා. බැකෝ යන්ත්‍රය දිගටම කුළී පදනම මත සපයන ලද්දේනම් ආදායම් තත්ත්වය වෙනස් විය යුතු බැවින් 2022 වසරේ ජනවාරි සිට ඔක්තොම්බර් මේ දක්වා උපයා ඇති ආදායම පිළිබඳව මී ළඟ සභා වාරයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා. මේ ආකාරයට ඇස්තමේන්තු සකස් කළත් මුදල් නොලැබෙන බැවින් මෙම අයවැය කෙටුම්පත සඳහා පක්ෂ වෙන්න බැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
ජනතාවගේ පොදු අවශ්‍යතා ඉටු කිරීම සඳහා ආදායම් උපයාගැනීමට ජනතාවට බදු බර පැනවීමකින් තොරව සම්ප්‍රධානුකූලව ක්‍රමානුකූලව හා නිසියාකාරව අසීරුතා මැද අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබෙනවා. සුභාසාධක සේවා මෙන්ම, පුස්තකාලයේ උඩු මහල සංවර්ධනය කිරීම, පෙර පාසල් පවත්වාගෙන යාම, ගලගම ළමා උද්‍යානය සංවර්ධනය කිරීම, පින්නවල නව නගරයට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ පැවැත්වීමට උත්සහ දැරීම වැනි සාධනීය අවස්ථා මෙහි ගැබ්ව තිබෙනවා.

වැටුප් හා දීමනා ගෙවීම සඳහා 57 .05 % කුත්, ගමන් වියදම් සඳහා 1. 32% කුත්, සැපයුම් හා උපකරණ සේවා සඳහා 17.62% කුත්, ප්‍රාග්ධන වත්කම් නඩත්තුව සඳහා 10.37% කුත්, ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා සේවා සඳහා 8.83 % කුත්, පොලිය හා ලභාංශ 0.08% කුත්, ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර 2.01%කුත්, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සඳහා 2.73% කුත්, වශයෙන් එකතුව ලැබෙන සේ මෙම ආදායම් 100% ගණනය වී තිබෙනවා. ඒ අනුව බල ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සේවා ලබා දීම සඳහා කටයුතු කර ඇති බව පේනවා. අනෙකුත් කටයුතු සඳහා අණ පනත් සහ චක්‍රලේඛ අනුව කටයුතු කිරීම අපහසු බැවින් ගරු

ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව තැන්පත් කරන ලද ලක්ෂ හතළිහක මුදල මන්ත්‍රීවරුන්ට සංවර්ධන යෝජනා සඳහා ලබා දීමට කටයුතු කරන බව ප්‍රකාශ කළා. සභා බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් නියමිත සේවා සිදු කිරීම සඳහා ශක්තියක් වීමට අයවැය ලේඛනයට දායකත්වය ලබා දී පක්ෂව කටයුතු කළා.
ග්‍රාම සේවා වසම් 50 තුල ඇති මාර්ග සිතියම් ගත කිරීමෙන් අනතුරුව, සභා අරමුදලින් මාර්ග මැනුම් කටයුතු සිදු කර ගැසට් කිරීමට කටයුතු කල යුතුයි. යටිතල පහසුකම් නිසියාකර නොවන අවස්ථාවල් වලදී මාර්ග හා යාබදව පිහිටි කුඹුරු හා ඉඩම් හිමිකරුවන් විසින් තම ඉඩම් සඳහා මාර්ගය ග්‍රහනයට හසුකරගනිමින් පවතිනවා. එම නිසා නිත්‍යානුකූල ආකාරයට මාර්ග සිතියම්ගත කර ගැසට් කිරීමට කටයුතු සැලසිය යුතුයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එච්.එම්.ගුණසේන මැතිතුමාගේ ඉල්ලීම අනුව, 2022 වසරේ ඔක්තෝම්බර් මස දක්වා සභාවට අයත් බැකෝ යන්ත්‍රය කුළී පදනම මත සැපයීමට අදාල තොරතුරු ඊ ළඟ සභාවාරයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් අනුව,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව, බලන්ගොඩ ප්‍රාදේශීය සභාව, බලන්ගොඩ නගර සභාව යන ආයතන 04 එකතුවී මාර්ග සිතියම් ගත කිරීම සහ ගැසට් කිරීමට අදාලව ජී.අයි.එස්. තාක්ෂණය භාවිතා කර පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සලසා ඇති බවත් එමඟින් නිලධාරීන් පුහුණු කිරීමටත් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමටත් කටයුතු සලසා ඇති බව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දන්වා එවා තිබෙනවා. ඒ අනුව ග්‍රාම සේවා වසම් 50 තුලම ඇති මාර්ග සියල්ලම ගැසට් කරවා ගැනීමට හැකියාව ලැබෙනවා.

ඒ අනුව සාකච්ඡා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද 2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභා සම්මත කිරීමට යෝජනා ස්ථිර කිරීමත් සමඟ, විරෝධතාවයක් ඉදිරිපත් වූ බැවින් ඡන්ද විමසීමෙන් අනතුරුව, වැඩි ඡන්ද 16 කින් 2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සභා සම්මත වූ අතර එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

(ii). සභාවට අයත් ගලගම ජල යෝජනා ක්‍රමයෙන් පවුල් 900 කට වඩා ජලය පරිභෝජනය කරනු ලබන බවත්, වන සතුන් ගැවසීම හේතුවෙන් නිරන්තරයෙන් එම ජල ව්‍යාපෘතිය අපිරිසිදු භාවයට පත්වීමට ඉඩ ඇති බැවින් එම ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අදාලව, දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමෙන් අනතුරුව, එම ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට කටයුතු කරන බව සඳහන් කරමින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදි.

දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමෙන් අනතුරුව, මෙම ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා නැවතත් අදහස් දක්වමින්,
වන සතුන්ගේ අපද්‍රව එකතු විම නිසා එම ජල ව්‍යාපෘතිය අපිරිසිදු වේ. එමෙන්ම සභාවට අයත් ජල ව්‍යාපෘති වල ජලනල එළලීම, ජල කරාම යෙදීම අක්‍රමවත් වීමෙන් ජල ව්‍යාපෘති නඩත්තුව සඳහා යොමු කරන නිලධාරීන් අසීරුතාවයට පත්වන බව දක්නට තිබෙනවා. එම නිසා ජල ව්‍යාපෘති නඩත්තුව සඳහා යොදවන ඕනෑම නිලධාරියෙකුට එම ජල ව්‍යාපෘති නඩත්තු කිරීමට හැකිවන පරිදි ජල කරාම සහ ජලනල එළලීමට කටයුතු කල යුතුයි. එමෙන්ම ගලගම ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමෙන් අනතුරුව, බෙලිහුල්ඔය නගරයට එක් ජලනල පද්ධතියක් සහ අනෙකුත් ප්‍රදේශ සඳහා වෙනත් ජල නල පද්ධතියක් ඉදි කර ජල සැපයුම් ලබා දීම සුදුසුයි.

ඉහත සඳහන් යෝජනාව අතරතුර දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමෙන් අනතුරුව, පින්නවල කුඩා නගරය සංවර්ධනය කිරීම ක්‍රියාත්මක කල යුතු බව ගරු සභාපතිතුමා විසින් ලිඛිත යෝජනාවක් නොමැතිව වාචික යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලදි.

පින්නවල නගරය ඉදි කිරිමට අවශ්‍ය වන ඉඩම් ප්‍රමාණය හෝ නිදහස් කර ගැනීමට කටයුතු කිරීම සඳහා ණය මුදලක් ලබා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව, දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමෙන් අනතුරුව, ගලගම ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය. පින්නවල නගරය සංවර්ධනය කිරිමට අදාල යෝජනාව ඉදරි සභාවාරයට ඉදිරිපත් කිරීමට තීරණය විය.

(iii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් දියපහස සංචාරක ගිමන්හල වසර දෙකක කාලයක් සඳහා බඳු දී ඇති අතර, ගිවිසුම් කාලය තුලරට තුල ඇති වූ කොරෝනා වසංගත තත්ත්වයත්, ආර්ථික හා දේශපාලන වශයෙන් රට අස්ථාවර වීම නිසා ගිවිසුම් කාලය අවසන් වීමෙන් අනතුරුව ඉදිරි මාස අටක කාලයක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව රු. 26 590/- ක මුදලටම දියපහස සංචාරක ගිමන්හල පවත්වාගෙන යාම සඳහා ලබා දෙන ලෙසට ඉල්ලුම් කරමින් බලංගොඩ, ඕලුගංතොට, ගඟ අද්දර පාර, 975/ජේ හි පදිංචි අනෝජ් මාතරගේ ඉන්දික මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

එම ඉල්ලුම්කරුටම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව රු. 26 590/- ක මුදලටම ඉදිරි මාස අටක කාලයක් සඳහා දියපහස සංචාරක ගිමන්හල පවත්වාගෙන යාම සඳහා ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ගිවිසුම් කාලය අවසන් වීමෙන් අනතුරුව, ඉදිරි මාස අටක කාලයක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව රු. 26 590/- ක මුදලටම දියපහස සංචාරක ගිමන්හල පවත්වාගෙන යාම බලංගොඩ, ඕලුගංතොට, ගඟ අද්දර පාර, 975/ජේ හි පදිංචි අනෝජ් මාතරගේ ඉන්දික මහතාටම ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

(iv). ආබාධිත තත්ත්වයෙන් පසුවන බැවින් ප්‍රජා සත්කාරයක් ලෙස නොමිලයේ ජල සම්බන්ධතාවයක් ලබා දෙන ලෙසත්, නිවස අසලට විදී පහනක් සවි කරවා දෙන ලෙසත් පින්නවල, පොළ භූමිය අසල පදිංචි ඩී.එම්. සෙනෙවිරත්න බණ්ඩාර මහතා විසින් සහ ඔහු පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන ලද පින්නවල පදිංචි රියෙන්සි කුරේ මහත්මිය විසින් ඉදිරිපත් කල ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
ප්‍රජා සත්කාරයක් ලෙස මෙම ඉල්ලුම්කරු ජීවත්ව සිටින කාලය තුල පමණක් නොමිලයේ ජල සබඳතාවයක් ලබා දිමත්, ජල මීටර් සවි කිරීමෙන් අනතුරුව මාසිකව ජල ඒකක 10 ක ප්‍රමාණයක් නොමිලයේ ලබා දීමත් එම ජල ඒකක ප්‍රමාණය ඉක්මවා ජලය පරිහරණය කරනු ලබන අවස්ථාල්වලදී එම ජල ප්‍රමාණය සඳහා සභාවේ අනුමත ජල ගාස්තු අය කිරීමටත් කටයුතු කල යුතු බව ප්‍රකාශ කරන ලදි.

ඉල්ලුම්කරුට නොමිලයේ ජල සබඳතාවයක් ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
ඒ මහතාට සනීපාරක්ෂක කටයුතු පවත්වාගෙන යාම සඳහා වැසිකිළි පද්ධතියක් නොමැතිකම තවත් විශාල ගැටලුවකි. ප්‍රදේශවාසීන් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දිමට සූදානමින් සිටිනවා. නිර්මාණ බිහිකරන කළාකරුවෙකි. සභාව මැදිහත් වී ඒ සඳහා සහයෝගය ලබා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා අදහස් දක්වමින්,

වැසිකිළියක් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ළඟම ඥාතියෙකුගෙන් ලබා ගැනීමට හැකි බව ප්‍රකාශ කිරීමත් සමඟ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ජී සමන්ත ජයසිංහ මැතිතුමා නැගී සිටිමින් වැසිකිළි පහසුකම් සපයා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙමු යනුවෙන් ප්‍රකාශ කරන ලදි.
ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
වැසිකිළි පද්ධතිය සකස් කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමාත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ජී සමන්ත ජයසිංහ මැතිතුමාත් සම්බන්ධ වී අවශ්‍ය වැඩ පිළිවෙල සංවිධානය කරන්න. සභාව විසින් අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කරනවා.

ඒ අනුව ජල සබඳතාවය ඉල්ලා සිටින ඉල්ලුම්කරු ජීවත්ව සිටින කාලය තුල පමණක් ප්‍රජා සත්කාරයක් ලෙස ජල මීටර් සවි කිරීමෙන් අනතුරුව, මාසිකව ජල ඒකක 10 ක ප්‍රමාණයක් නොමිලයේ ලබා දීමටත්, එම ජල ඒකක ප්‍රමාණය ඉක්මවා ජලය පරිහරණය කරනු ලබන අවස්ථාවල් වලදී ඒ සඳහා සභාවේ අනුමත ජල ගාස්තු අය කිරීමටත් මහ සභාව තීරණය කර අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(v). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට 2023 වර්ෂය සඳහා ද්‍රව්‍ය හා සේවා සැපයීම සම්බන්ධයෙන් ඇමුණුමෙහි සඳහන් පරිදි අනු අංක පී.එස්. 01 සිට පී.එස්. 31 දක්වා අයිතම සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරවා ගැනීමටත්, මෙම දැන්වීම සභා අරමුදලින් රජයේ පුවත්පත් වන දිණමින සහ තිනකරන් පුවත්පත්වල පල කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට 2023 වර්ෂය සඳහා ද්‍රව්‍ය හා සේවා සැපයීම සම්බන්ධයෙන් ඇමුණුමෙහි සඳහන් පරිදි අනු අංක පී.එස්. 01 සිට පී.එස්. 31 දක්වා අයිතම සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරවා ගැනීමටත්, මෙම දැන්වීම සභා අරමුදලින් රජයේ පුවත්පත් වන දිණමින සහ තිනකරන් පුවත්පත්වල පල කිරීමත් සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ජී. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට සභාවට 2023 වර්ෂය සඳහා ද්‍රව්‍ය හා සේවා සැපයීම සම්බන්ධයෙන් ඇමුණුමෙහි සඳහන් පරිදි අනු අංක පී.එස්. 01 සිට පී.එස්. 31 දක්වා අයිතම සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරවා ගැනීමටත්, මෙම දැන්වීම සභා අරමුදලින් රජයේ පුවත්පත් වන දිණමින සහ තිනකරන් පුවත්පත්වල පල කිරීමට කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vi). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව මඟින් 2002, 2003, 2005, 2006, 2009, 2010 වර්ෂවල සිදුකල කර්මාන්ත හා වෙනත් සේවාවන් සඳහා ලබා දී ඇති අත්තිකාරම් වශයෙන් රු. 3070431.34/- ක මුදලක් අත්තිකාරම් ලේඛනයේ වසරින් වසර ශේෂ වී නොපියවූ අත්තිකාරම් වශයෙන් පවතින බැවින් ඒ සඳහා විගනන විමසුම් ගණනාවක් පවතින බවත්, කාර්යාලයීය ලේඛන අනුව මෙම මුදල් ඒ ඒ කාල වකවානුවලදීම පියවී ඇති බවට සාක්ෂි නොමැති බවත්, එම කාල වකවානුවල බොහෝ ලේඛන ද සොයා ගත නොහැකි බවත්, අත්තිකාරම් පියවා ඇති නමුත් නිසිපරිදි ලේඛන වල ඇතුළත් නොවීම නිසා මෙම ගිණුම් ශේෂ ඉදිරියට රැගෙනවිත් ඇති බවට අනුමාන කල හැකි බවත්, එබැවින් නොපියවූ අත්තිකාරම් ලෙස සටහන් වී ඇති මුදල් ලේඛන වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
නොපියවූ අත්තිකාරම් කපා හැරීමේ මෙම යෝජනාව පසුගිය සභා වාරයකදී ඉදිරිපත් කර සභා අනුමැතියෙන් පසුව පළාත් සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කළත් නැවතත් එම යෝජනාව සංශෝධනය කර එවන ලෙස සබරගමුව පළාත් සභාව විසින් දන්වා එවා ඇති බැවින් සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කළා. විවිධ සේවා සමූපාකාර සමිතියෙන් ඉන්ධන ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද අත්තිකාරම් මුදල හැර අනෙකුත්

නොපියවූ අත්කාරම් කපා හැරීම සඳහා සහා අනුමැතිය ලබා ගතයුතුය. මේ පිළිබඳව සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

නොපියවූ අත්තිකාරම් කපා හැරීමේ යෝජනාව සාකච්ඡා කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

එම සාකච්ඡාවෙන් අනතුරුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්විය.

නොපියවූ අත්තිකාරම් පිළිබඳ ලේඛන විශ්ලේෂණය කිරීම, අධීක්ෂණය කිරීම, විමර්ශනය කිරීම සඳහා අවශ්‍ය මන්ත්‍රීවරුන්ට ලබා දීමෙන් අනතුරුව, නොපියවූ අත්තිකාරම් ඊළඟ සභාවාරයට ඉදිරිපත් කර ලේඛන වලින් ඉවත් කිරීම සඳහා සහා අනුමැතිය ලබාදීමටත්, මුදල් අවභාවිතා වීමක් සිදු වී ඇති බව පසක් වනනේනම් නිත්‍යානුකූලව නීතිමය පියවර ගැනීමටත් කාරක සභා අවස්ථාවේ දී තීරණය කරන ලදි.

ඒ අනුව නොපියවූ අත්තිකාරම් ලේඛන වලින් කපා හැරීමේ යෝජනාව ඊළඟ සභාවාරයට ඉදිරිපත් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(vii). පඹහින්න පොළභූමිය අයත් ගොඩනැගිල්ල සහ එම භූමිය කුළී පදනම මත වාහන අලුත්වැඩියා කිරීමේ ආයතනයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ලබා දෙන ලෙසට බෙලිහුල්ඔය, මුත්තෙට්ටුවේගම, මහතැන්න පදිංචි ටී.බී. සමන්ත මනෝජ් මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
රටතුල පැවැති කොරෝනා වසංගත තත්ත්වය නිසා පඹහින්න පොළ භූමියේ සංවර්ධන කටයුතු ප්‍රමාද වුවත්, ඉදිරියේ දී දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබාගැනීමෙන් අනතුරුව, පඹහින්න පොළ භූමිය සංවර්ධනය කිරීමට නියමිතයි. එහෙත් සභාවට අයත් මෙම පොළ භූමිය දැනට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පවතින බැවින් සභාවට යම් ආදායමක් උපයා ගැනීමට යෙදවීමේ දී ඒ සඳහා මාසික කුළී මුදලක් තීරණය කිරීමට කාර්මික නිලධාරි මහතාගෙන් දල තක්සේරුවක් හා තත්ත්ව වාර්තාවක් ලබාගෙන ඉහත ඉල්ලීම සලකා බැලීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

කාර්මික නිලධාරි මහතාගේ තක්සේරු වාර්තාව අනුව තැන්පතුවක් රඳවාගෙන මාසික කුළී පදනම මත පඹහින්න පොළභූමියට අයත් ගොඩනැගිල්ල සහ එම භූමිය වාහන අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලුම්කරු වෙත ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව කාර්මික නිලධාරි මහතාගෙන් දල තක්සේරුවක් හා තත්ත්ව වාර්තාවක් ලබාගෙන ඉහත ඉල්ලීම සලකා බලා, පඹහින්න පොළ භූමියට අයත් ගොඩනැගිල්ල සහ එම භූමිය වාහන අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම සඳහා ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

### (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද සැප්තැම්බර් මස 01 වන දින සිට සැප්තැම්බර් මස 30 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 93 සහ වවුචර් අංක 713 සිට 810 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන 2022.10.03. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ

අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ජ්. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවේ අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

## (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2022.10.03. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,
01. ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා වැසිකබා මිලදී ගැනීම වෙනුවෙන් මිළ මිල ගණන් කැඳවීම.
02. ප්‍රාදේශීය සභාවේ LF – 6966 කැබ් රථයට වාහන බැටරියක් හා ටයර් මිලදී ගැනීම, ZA – 5076 - JCB යන්ත්‍රයට බැටරියක් මිලදී ගැනීම හා 252 – 6347 වාහනය සඳහා ටයර් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
03. ප්‍රධාන කාර්යාලය සඳහා මුද්‍රිත ලේඛන මිලදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.
04. ප්‍රාදේශීය සභා පෙර පාසල සඳහා පෙර පාසල් ටී ෂර්ට් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
05. ප්‍රාදේශීය සභාවේ ගිනි නිවන උපකරණ යාවත්කාලින කිරීම සඳහා මිළ ගණන් කැඳවීම.
06. ජල ව්‍යාපෘති සංවර්ධන වැඩ කටයුතු සඳහා ජල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභා අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ජ්. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2022 සැප්තැම්බර් මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

(i). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
මා නියෝජනය කරනු ලබන කොට්ඨාසයේ ජල පාරිභෝගිකයන්ට ජලය බෙදා හැරීමේ ක්‍රියාවලියේ පැවැති දූර්වලතා මඟ හරවා ගැනීම සඳහා ගරු සභාපතිතුමා, ලේකම්තුමිය කාර්මික නිලධාරි මහතා විශාල සහයෝගයක් ලබා දීම නිසා පැවැති ගැටළු අවම කර ගැනීමට හැකි වුණා.
එමෙන්ම පඹහින්න සහ ගලගම ප්‍රදේශවල ජනතාවට ජල ගාස්තු ගෙවීම සඳහා මොරහැල ප්රධාන කාර්යාලයට බොහෝ දුරක් පැමිණීමට සිදුවන නිසා පඹහින්න ප්‍රදේශයේ සහ ගලගම ප්‍රදේශයේ තෝරා ගත් ස්ථාන දෙකක සභාවේ එක් නිලධාරියෙකු සේවයේ යොදවා ජල ගාස්තු අය කර ගන්නා ලෙසට මා විසින් ඉල්ලීමක් කළා. එහි ප්‍රගතිය පිළිබඳව විමසීමට මා කැමතියි.
එමෙන්ම පසුගිය සභාවාරයකදී පඹහින්න පොදු වැසිකිළියේ ගලිවල සංවර්ධනය කිරීම සඳහා මහ සභා අනුමැතිය ලැබුණා. එම සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට පෙර එම ගලිවල හිස් කල යුතු බැවින් නගර

සභාවෙන් ගලිවල හිස් කර දෙන ලෙස ඉල්ලීමක් කළොත් විශාල පිරිවැයක් ඇරිමට සිදු විය හැකි නිසා ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයෙන් ඒ සඳහා ඉල්ලීමක් කරන්න.
වන සංරක්ෂන දෙපාර්තමේන්තුවේ මුත්තෙට්ටුවේගම, පඹහින්න, කිංචිගුණේ, වසම්භාරව කටයුතු කරන නිලධාරියා එම ප්‍රදේශවල නිවැසියන් බිය ගන්වා මුදල් ලබා ගන්නා බවට චෝදනාවක් තිබෙනවා. මේ පිළිබඳව අදාල අංශ දැනුවත් කිරීමටත්, ගම්වාසීන් සමඟ සාකච්ඡා කර එම ගැටලුව විසඳීමටත් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
එ.ජා.ප. මහලේකම්තුමා විසින් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ එ.ජා.ප. කණ්ඩායම් නායකයා ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ජී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා පත් කර ඇති බව දන්වා එවා තිබුණා. ප්‍රාදේශීය සභාවක ගරු සභාපති, ගරු උප සභාපති ඇතුළු මන්ත්‍රී මණ්ඩලයක් පමණක් සිටින බව ගරු සභාපතිතුමා කලින් විග්‍රහ කර දී ඇති ආකාරයට මා දැන සිටියා. මහ ලේකම්තුමාගේ දැනුම් දීම මත ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ජී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා එ.ජ.ප. විපක්ෂ නායකයා ලෙස එතුමාගේ නිල මුහුණු පොත සමාජ මාධ්‍ය ජාලය ඔස්සේ ප්‍රචාරය වී තිබුණා. එම ප්‍රචාරයත් සමඟ ඒ පිළිබඳව අපෙන් විමසීම් කරනවා. අපට පිළිතුරු දිය නොහැකියි. එම ප්‍රචාරය අනුව එවැනි තනතුරක් ප්‍රාදේශීය සභාව තුල තිබේද? එතුමාට විපක්ෂ නායක තනතුර ලැබී ඇත්තේ එ.ජා.ප. තුලිනි. අප නියෝජනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිසා එය අපට වලංගු නැහැ. එය එතුමන්ලාගේ පක්ෂය ඇතුලේ ගැටලුවක්. සමාජ මාධ්‍ය ජාලා මඟින් වැරදි තොරතුරක් සමාජ ගත වී ඇත්නම් සමාජ මාධ්‍ය ජාලය තුලින්ම එය නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිනවා.
කිංචිගුණේ මාර්ගය සංවර්ධනය කිරීමේ දී මුංගස්තැන්න සුසාන භූමියෙන් පස් කපාගෙන ඇති බව ගම්වාසීන් මඟින් දැනගැනීමට ලැබුණා. සභා බල ප්‍රදේශයේ පිහිටි බැවින් එම සුසාන භූමිය සභාවට අයත් බැවින් ගරු සභාපතිතුමා ඒ පිළිබඳව දැනුවත්ද? එසේ පස් ගැනීමක් සිදු වූයේ කෙසේද? ඔබතුමා ඒ පිළිබඳව සොයා බැලුවාද? නිරීක්ෂණය කළාද? ප්‍රාදේශීය ලේකම්තුමිය, ග්‍රාම නිලධාරි, ස්ථානීය පරීක්ෂණයක් සිදු කර එය තහනම් කිරීමෙන් එවැනි ක්‍රියාවලියක් අනිවාර්යයෙන් සිදු වී ඇති බව නිගමනය කල හැක. මාර්ගය සංවර්ධනය කිරිම යහපත් වුවත් ඒ සඳහා අවශ්‍ය පස් පෞද්ගලික ඉඩමකින් හෝ සුදුසු ස්ථානයකින් සුදුසු ක්‍රමවේදයකින් ලබා ගත යුතුයි. පස් කැපීම තහනම් කල පසුව කපන ලද පස් ස්ථාන දෙකක ගොඩ ගසා ඇති බව දැන ගන්නට ලැබුණා. කෘෂි පීඨයට ප්‍රවේශ මාර්ගය ආසන්නයේ ඇති ක්‍රීඩා පිටියක් සංවර්ධනය කිරිම සඳහා යොදා ගන්නා බව දැන ගැනීමට තිබෙනවා. එසේ සිදු වන්නේ එම ක්‍රීඩා සමාජයේ ක්‍රියාකාරීන්ගේ ඉල්ලීම මත ද දැන ගැනිමට කැමතියි. ඉතිරි පස් කංචිගුණේ පන්සල ළඟ ගොඩගසා ඇති බව දැන ගන්නට තිබෙනවා. මෙම පස් සඳහා සභාවට ගෙවීමක් කර තිබෙනවාදැයි දැන ගැනිමට කැමතියි. නොමැතිනම් අය කර ගැනිමට කටයුතු කරන්න. සොයා බලන්න. එහි විස්තර ඉදිරි සභාවාරයේ දී දැන ගැනිමට කැමතියි.
උග්ගල් අලුත්නුවර කතරගම මහා දේවාලයේ දින පහේම පෙරහැර නැරඹීම සඳහා ප්‍රවේශ පත්‍රයක් සහ රථ ගාල් කිරීම සඳහා ප්‍රවේශ පත්‍රයක් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලීමක් කළා. එහෙත් 05 වන දින පෙරහැර නැරඹීම සඳහා පැමිණෙන ලෙසට ආරාධනා පත්‍රය 06 වෙනිදා ලැබුණා. සමාජ ක්‍රියාකාරී මහජන නියෝජිවරුන්ට ඒ සඳහා එක් නිශ්චිත දිනයකදී යන්න බැහැ. පවුල සහ දරුවන් සමග අවශ්‍ය දිනෙක ඒ සඳහා යාමට අවසර ලබා දිය යුතුයි.

(iii). ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ලඳුයාය මාර්ගය සංවර්ධනය කිරිම සඳහා කොන්ත්‍රාත් සමාගමකට පවරා එහි සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති නමුත් වර්තමානය වන විට එහි සංවර්ධන කටයුතු අතරමඟ නැවතිලා. මෙම මාර්ගය පළාත් සභා මාර්ගයකි. වාහන ගමනාගමනයට බාධා එල්ල වන ආකාරයට මාර්ගය අබලන් වෙලා. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තාර යොදා මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කරන බව ප්‍රකාශ කලත් කොන්ත්‍රාත් සමාගම එම කටයුතු සිදු කරන්නේ නැහැ. කොන්ත්‍රාත් සමාගම හෝ එම ආයතනය හෝ එහි අයිතිකරු පිළිබඳව දැන ගැනිමට නොහැකියි. එම නිසා මෙම මාර්ග සංවර්ධන කටයුතු කඩිනම් කර දෙන ලෙසට මාර්ග සංවර්ධන අධිකාරියට, පළාත් මාර්ග අමාත්‍යාංශය, ප්‍රවාහන හා මහා මාර්ග දෙපාර්තමේන්තුව දන්වා යැවීමට කටයුතු කරමු.
ගලගම ජල ව්‍යාපාතිය සඳහා ජල පිරිපහදුවක් ස්ථාපිත කිරීමට අවශය කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරමු.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ජී. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා අදහස් දක්වමින්,

බල ප්‍රදේශයේ සංවර්ධන යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බව ප්‍රකාශ කළා. එම ප්‍රතිපාදන ලබා දීමේ දී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. 2023 වර්ෂය සඳහා අයවැය කෙටුම්පත මා කියවා බැලුවා. නිරීක්ෂණය කළා. ඒ තුල මා වරදක් නුදුටු නිසා ඒ සඳහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කරමින් සහයෝගය ලබා දුන්නා. වර්තමාන උප සභාපතිතුමාගේ පියා උප සභාපති ලෙස මෙම සභාව නියෝජනය කරන ලද කාලයේ දී ටී.බ.මු. වීරසේකර බණ්ඩාර මැතිතුමා සභාපතිවරයා ලෙස කටයුතු කරන ලද කාලයේ ඊ.ඒ. වජිර දිසානායක මැතිතුමා විපක්ෂ නායක ලෙස කටයුතු කර තිබෙන බව කුමරතුඟු මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ පලකයේ සටහන් කර තිබෙනවා. හිටපු ලසන්ත මැතිතුමාගේ කාලයේ එතුමා විපක්ෂ නායක ලෙස හඳුන්වා තිබෙනවා.

ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සහ අදහස් සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා පිළිතුරු සහ විසඳුම් ලබා දීමට අදහස් දක්වමින්,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
පඹහින්න පොදු වැසිකිළිය සබරගමුව විශ්ව විද්‍යාලයේ සිසුන් වැඩි වශයෙන් භාවිතා කිරිම නිසාත් ප්‍රජා සත්කතාරක සේවයක් ලෙසිනුත් පඹහින්න ගලිවල ඉවත් කිරිම සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයට අයත් ගලිබවුසරය ලබා දිමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස උපකුලපතිතුමාට දන්වා යැවිමට කටයුතු කරනවා.

ලිඛිත පැමිණිල්ලක් නිශ්චිත පැමිණිල්ලක් ඉදිරිපත් නොවිම ගැටලු සහගත වුවත් වන සංරක්ෂණ දේපාර්තමේන්තු නිලධාරියා පිළිබඳව සොයා බැලීමටත්, දිස්ත්‍රික් සම්බනධීකරණ කමිටු ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමාට ඒ බව දැනුවත් කිරිමටත් කටයුතු කරනවා. ලිඛිතව ඉදිරිපත් කරන්නේනම් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ හැකියි.

පඹහින්න සහ ගලගම ජල යෝජනා ක්‍රමවල මාස කිහිපයක් තුල ජල බිල්පත් නිකුත් නොකිරිම නිසා හිඟ ජල ගාස්තු අය කරගැනිමට අතපසුවී ඇති බැවින් ඒ සඳහා කඩිනම් විසඳුමක් වශයෙන් එම ප්‍රදේශ සඳහා නිලධාරියෙක් යොදවන ලෙස කළ ඉල්ලිම අතපසු කිරිම පිළිබඳව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මාගේ කණගාටුවට පල කරනවා. මේ සම්බන්ධව ලේකම්තුමිය සමඟ සාකච්ඡා කල අවස්ථාවේදී නිලධාරින් මෙහෙයවීමේ දී ඒ සඳහා ගරු සභාපතිතුමාගේ අත පෙවිම නිසා පරිපාලන කටයුතු මෙහෙයවීම අපහසු බව ප්‍රකාශ කිරිමත් සමඟ කාර්මික නිලධාරි මහතා හා ලේකම්තුමිය මැදිහත් වී අවශ්‍ය පරිපාලනය කටයුතු කිරිමට අවස්ථාව ලබා දුන්නා. එම නිසා ඉදිරියේ දී මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න.

එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා නැවතත් අදහස් දක්වමින්, මේ පිළිබඳව කාර්මික නිලධාරි මහතාගෙන් මා විමසූ අවස්ථාවේ දී සුදුසු වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරිම සඳහා ලේකම්තුමිය වෙත භාර දී ඇති බවත් ක්‍රියාත්මක කිරීම සඳහා ලේකම්තුමියගේ සහයෝගය අවශ්‍ය බවත් ප්‍රකාශ කළා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
කිංචිගුණේ මාර්ගය සංවර්ධනය කිරිම සඳහා මුංගස්තැන්න සුසාන භූමියෙන් පස් ලබා ගැනීමට පෙර සභාවෙන් අවසර ලබාගත යුතු වුවත් අවසර ලබාගෙන නැහැ. එමෙන්ම පස් කමිටුවෙන් ද අවසර ලබා ගත යුතුයි. මා මීට පෙර ඒ පිළිබඳව දැනුවත් වුණේ නැහැ. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් සහ වසම භාර ග්‍රාම නිලධාරිගෙන් විමසා බලා ඊ ළඟ සභා වාරයට තොරතුරු ඉදිරිපත් කිරිමට කටයුතු කරනවා. එහෙත් කිංචිගුණේ සහ නෙල්ලිවල මාර්ගය සංවර්ධනය කිරීමේ දී මාර්ගය දෙපස ඉවත් කරනු ලබන කසල කොටස් ගොඩගැසීමට අවසර ඉල්ලා සිටියා. කිංචිගුණේ මාර්ගයේ ඉවත් කරනු ලබන කසල කංචිගුණේ පන්සලේ ගොඩගැසීමට අවසර ඉල්ලිමත් සමඟ පන්සලේ ස්වාමීන් වහන්සේගෙන් විමසා බලා ඒ සඳහා අවසර ලබා දුන්නා. උඩවෙල මාර්ගය සංවර්ධනය කිරීමේ දී එහි එක් ස්ථානයකින් පස් කපා ගැනීමත් සමඟ ප්‍රාදේශීය සභාව මැදිහත් වී පස් කැපීම නතර කළා. ඒ සම්බන්ධව සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් වුණා.

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් ලැබෙන සහයෝගය මත උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ පෙරහැර සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් විශාල දායකත්වයක් ලබා දීමට හැකි වූ බවත්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාපතිවරයා ලෙස බස්නායක නිලමේතුමාට දැනුම් දුන්නා. පෙරහැර පිළිබඳව මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙස බස්නායක නිලමේතුමාට මා දැනුම් දිමත් සමඟ ඊට අදාල ලිපි මාගේ

නිවසට එවා තිබුණා. මන්ත්‍රී නමට ලිපි යොමු කර තිබූ බැවින් ඒවා විවාත කර නොබැලූ අතර, එම ලිපි කවර සභාවෙන් තැපැල වෙත යොමු කළා. රත්නපුර සමන් දේවාලයෙන් ප්‍රවේශ පත්‍රයක් සමඟ ආරධනා පත්‍රය ලැබෙනවා. ප්‍රවේශ පත්‍රයක් සහ ආරධනා පත්‍ර ලබා දිම පිළිබඳව බස්නායක නිලමේතුමාට මා ස්තුතිවන්ත වුණත් බලපොරොත්තු වු ආකාරයට එම කාරණය සිදු නොවීම නිසා ඉදිරියේ දී පවත්වනු ලබන පෙරහැර සඳහා රථ ගාල් කිරීම, ආසන පැනවීම සම්බන්ධයෙන් බස්නායක නිලමේතුමා දැනුවත් කරනවා.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
වාහන ගමනා ගමනයට පහසුවන ආකාරයට ලඳුයාය මාර්ගය සංවර්ධනය කිරිම පිළිබඳව විධායක ඉංජිනේරු, මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශයත් පළාත් මාර්ග අමාත්‍යාංශයත් දැනුවත් කිරීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
සභාපති, ගරු උප සභාපති, ඇතුළු මන්ත්‍රී මණ්ඩලය ප්‍රාදේශීය සභාව නියෝජනය වුවත් සම්ප්‍රධායානුකූල ආකාරයටත්, පක්ෂ ජෝෂ්ඨත්වයත් අනුව විපක්ෂ නායක ලෙස ආසන පැනවීමට කටයුතු කළා. පලකයේ සටහන් කර ඇති ආකාරයට ටී.බ.මු. වීරසේකර බණ්ඩාර ගරු සභාපතිතුමාගේ සහ ජස්ටින් එදිරිවර මන්ත්‍රීතුමාගේ කාලයේ වජිර දිසානායක මැතිතුමා විපක්ෂ නායක ලෙසත්, ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා සභාපතිවරයා ලෙස ධුරයේ සිටි කාලයේ ලසන්ත මැතිතුමා විපක්ෂ නායක ලෙසත් සලකා තිබේ. මේ සභා වාරයේ සමන්ත මැතිතුමා නාමිකව විපක්ෂ නායක ලෙස සැලකුවා. එ.ජා. ප. විසින් කණිෂ්ඨම මනිත්‍රීවරයෙක් වන ගරු උපුල් මැතිතුමා කණ්ඩායමේ නායක ලෙස පත්කර එවා තිබීම මෙපමණ කාලයක් නොතිබුණු ගැටලුවක්. විපක්ෂ නායක තනතුරක් නොතිබුණත් සම්ප්‍රධායානුකූලව සැලකීමක් කල නිසා එ.ජා.ප. නියෝජනය කරනු ලබන මන්ත්‍රී කණ්ඩායම මේ පිළිබඳව සාකච්ඡා කර ලේකම්තුමිය වෙත දැනුම් දෙන්න. විපක්ෂ නායක තනතුර සම්ප්‍රධායානුකූලව පැවත එන නිසා පලකයේ නම සටහන් වී තිබෙනවා.

ගරු සභාපතිතුමා අදහස් ප්‍රකාශ කරමින් සිටින අතර වාරයේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා නැඟී සිටිමින් අදහස් දක්වමින්,
එ.ජා.ප. මහලේකම් විසින් උපුල් මැතිතුමා කණ්ඩායම් නායක ලෙස නම් කර එවා තිබුණත්, පක්ෂය තුල සංවිධායක තනතුරත් නම් කල යුතු වුවත් එ.ජා.ප. මහලේකම්තුමාට එය අමතකවීමක් විය හැකියි.

ලබන සදුදා දිනයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය කමිටු රැස්වීමක් පැවැත්වෙනවා. ඒ සඳහා ඔබතුමා ඔබතුමිය සහභාගි වන්න. කුමරතුඟු මහජන පුස්තකාලය විසින් පවත්වන ලද පොත් පෙරහැරට සහභාගී වූ ඔබ සැමට ස්තුතිය ප්‍රකාශ කරනවා.

(09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.
ඊළඟ සභා වාරය නොවැම්බර් මස 15 වන අඟහරුවාදා දින පැවැත්වීමට කටයුතු කරනවා.

(10). ස්තුති කතාව හා අවසානය.
හත්වන සභාවේ පනස් පස්වන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි.

ඉන් අනතුරුව, පෙ.ව. 11.48 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.